# උපනිෂද් අධ්‍යාපනය

**පුලියන්කුලමේ විමලබුද්ධි හිමි**

## ප්‍රවේශය

වේදය මූලබීජය කර ගනිමින් ක්‍රමිකව වර්ධනය වූ භාරතීය චින්තන ධාරාව එහි කූඨප්‍රාප්තියට පත්වන්නේ උපනිෂද් යුගයේය. පෙරදිග දර්ශන සම්ප්‍රදාය තුළ බුද්ධි විෂයික ඥාන මාර්ගයක් කරා උපනිෂද් දර්ශනය යොමු වූ අතර එහිදී මිනිස් චින්තනයේ ගැඹුර ස්පර්ශ කිරීමට එය සමත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නව චින්තන පෙරළියක් සිදු වූ අතරම එම චින්තනයන් අන්තර්ගත වුණු විසල් කෘති සමූහයක්ද සංග්‍රහ විය.

ආදි භාරතීය චින්තන ධාරාවේ කැඩපත වේදයයි. තත් සාහිත්‍යයෙහි සුවිශේෂී වූ අවසන් කොටස හෙවත් පරිණත අවස්ථාව උපනිෂද් සාහිත්‍යයයි. වෛදික සාහිත්‍යයේ ගූඪතම ආධ්‍යාත්මික විවරණයක් අන්තර්ගත එම සාහිත්‍යය පසුව බිහි වූ සමස්ත භාරතීය චින්තනයන්ට අවැසි පසුබිම සකස් කළ බව අවිවාදයෙන් පිළිගත හැකිය (විනීත හිමි, 2011:15).

බලදොර ඉන්දජෝති හිමි (2013) දක්වන අන්දමට, 'උපනිෂද්' යන වචනයට බොහෝ විද්වතුන් විසින් අර්ථකථන රාශියක් ඉදිරිපත් කර ඇත. එහි වඩාත් පිළිගත් අර්ථය වන්නේ උප+නී යන උපසර්ග පූර්ව කොට යෙදුන 'සද්' යන ධාතුවෙන් නිපන් පදයක් ලෙසය. එහි අරුත වන්නේ 'සමීපයේ හිඳ ගැනීමයි'. ඒ අනුව රහසිගත අර්ථය, රහස්‍ය ඉගැන්වීම, රහස් දෘෂ්ටිය ආදි අර්ථයන් 'උපනිෂද්' යන්නෙහි ගැබ්ව පවතින බව විචාරක මතයයි. ඒ අනුව පෙනෙන කරුණ නම් උපනිෂද් ධර්මය යනු රහසිගතව කියා දීමට උත්සහා ගත් ඉගැන්වීමක් බවයි.

වින්ටර්නිට්ස් (1967) පවසන අන්දමට, සියල්ලට වඩා උපනිෂදය ගුප්තය. එහි එන දෘෂ්ටිවාදයන් සකස් වූයේ පොදුජනයා සඳහා

නොවේ. එය කියාදෙන ලද්දේ වරප්‍රසාද ලත් ඉතා සුළු පිරිසකටය. ගැඹුරු දාර්ශනික දෘෂ්ටියක් වේවා, නිස්සාර සංකේත දෘෂ්ටියක් වේවා, භූතවිද්‍යා කර්මයක් වේවා මේ ආදි සියල්ලක්ම උපනිෂද් යනුවෙන් හැඳින්විය.

උපනිෂද් හි කාලය පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඉන්දියානු විචාරකයන් එය ඉතා ඈතකට ගෙන යන බව දැකිය හැකිය. රාධක්‍රිෂ්ණන් පඬිවරයාට අනුව එම කාලය ක්‍රි. පූ. 1500 සිට ක්‍රි. පූ. 300 දක්වා කාලය ඊට අයත්ය. එසේම ඇතැම් විචාරයන් එම කාලය ක්‍රි. පූ. 5000 දක්වා ඈතකට රැගෙන යන බව පෙනේ. කෙසේ නමුත් මෙම කෘතිවල අන්තර්ගතය, භාෂාව හා වෙනත් අභ්‍යන්තර සාධක අනුව බලන කල ඒවා එතරම් පැරණි නොවන බවද දැකිය හැකිය. දැනට අපට හමුවන කෘති සංඛ්‍යාව 108කි (ඇතැම් තැනක එය 200ක් ලෙසද දැක්වේ). නමුත් ප්‍රධාන උපනිෂද් වශයෙන් සලකන්නේ කෘති 12ක් පමණි. විශේෂයෙන් එම කෘති 12 වේද සංහිතාවන්ටද සම්බන්ධය. එනම්,

1. ඍග්වේදය - ඓතරේය උපනිෂදය
2. සාමවේදය - ඡාන්දෝග්‍ය, කේන උපනිෂද්
3. යජුර් වේදය - කඨ, තෛතරීය, ශ්වේතාශ්වතර, මෛත්‍රායණී, ඊශා, බෘහදාරණ්‍යක යන උපනිෂද්
4. අථර්ව වේදය - මාණ්ඩූක්‍ය, මුණ්ඩක, ප්‍රශ්න යන උපනිෂද්

වශයෙනි.

**සාකච්ඡාව**

මෙසේ ප්‍රවේශයක් වශයෙන් ඉහතදී උපනිෂද් හි ආරම්භය පිළිබඳ ඉතා සැකවින් නමුත් ප්‍රාමාණික හැඳින්වීමක් සිදු කෙරුණි. කෙසේ නමුත් මෙම සාකච්ඡාවේ අරමුණ එකී උපනිෂද් හි අන්තර්ගත ඒවායෙන් මතුකරන 'අධ්‍යාපනික' කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමයි.

ජයවර්ධන (2013) සඳහන් කරන අන්දමට, වෛදික සාහිත්‍යය තුළ දියුණුතම සාහිත්‍යාංගය වන්නේ උපනිෂද්ය. එසේම ඒ තුළින්

වෛදික යුගයේ අධ්‍යාපනය පිළිබඳ මනාව කරුණු විදහා දක්වන අතරම නිවැරදි වූ අධ්‍යාපනික ක්‍රමෝපායන් අපට හමුවන බවයි. ඒ අනුව උපනිෂද් හි අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ ශීර්ෂ කිහිපයක් යටතේ කරුණු ගොනු කිරීම මෙම සාකච්ඡාව ඉදිරියට ගලා යාම පහසු කරනු ඇත. ඒවා නම්,

- ශිෂ්‍යභාවය ලබා ගැනීම
- ශිෂ්‍යයා සතු යුතුකම්
- ශිෂ්‍ය විනය හා නීතිරීති
- ගුරු-ශිෂ්‍ය සම්බන්ධය
- ගුරුවරයාගේ යුතුකම් හා වගකීම්
- උපනිෂද් හි අන්තර්ගත විෂය ධාරාව
- අධ්‍යාපනය ලබාදුන් ක්‍රම
- ගුරුවරයාට සමුදීම

ආදි වශයෙනි.

**ශිෂ්‍ය භාවය ලබා ගැනීම**

වෛදික අධ්‍යාපනය ගත්කල වසර දහස් ගණනක ඉතිහාසයකට උරුමකම් කියනු ලබන්නකි. සෑම අධ්‍යාපන ක්‍රියාවලියක්ම පුද්ගලයා කේන්ද්‍ර කොටගෙන පවතී. වෛදික අධ්‍යාපනය පිළිබඳ ගත් කල ද එය එසේම දැකිය හැකිය. විශේෂයෙන් අධ්‍යාපන ක්‍රියාවලිය ගුරු-ශිෂ්‍ය සම්බන්ධතාවය මත ගලා යන්නකි. වෛදික අධ්‍යාපනය තුළ කුළුපග සම්බන්ධය 'උපනයන' ලෙසින් හඳුන්වනු ලැබේ. එය විශේෂිත වූ ආගමික ක්‍රියාවලියකි. එය මුදල් ගෙවා දරුවෙකු පාසලට ඇතුළත් කිරීමකට එහා ගිය ක්‍රියාපටිපාටියකි. විශේෂයෙන්ම ගුරුවරයා මවක් තම දරුවා ගැබේ හොවාගෙන ආරක්ෂා කරන්නා සේ ගුරුවරයාද තම ශිෂ්‍යයා තමා සමීපයේ තබාගෙන ආධ්‍යාත්මික හා සදාචාරාත්මක ගුණයන්ගෙන් පෝෂණය කර, ඔහුට දෙවැනි උපතක් ලබා දෙයි. එම ශිෂ්‍යයා 'ද්විජ' නමින් හඳුන්වන්නේ ඉන් අනතුරුවය. එයින් පසු ඔහු අරඹන ජීවිතය 'බ්‍රහ්මචාර්ය' නම් වන අතර, එය ප්‍රායෝගික ජීවන ප්‍රතිපදාවක් ලෙස හැඳින්විය හැකිය.

ඇකිරියගල නන්ද හිමි (2013) දක්වන ආකාරයට මෙම උපනයන ක්‍රියාවලිය පිළිබඳ ඓතරේය බ්‍රාහ්මණයෙහි (XI.5.4) සවිස්තරාත්මකව දක්වා ඇත. එහි සඳහන් ආකාරයට ගුරුවරයා තම දක්ෂිණ හස්තය ශිෂ්‍යයාගේ හිස මත තබා ආශිර්වාද කිරීමෙන් අනතුරුව ඔහු තම ශිෂ්‍යයෙකු බවට සංකේතවත් කරනු ලබයි. එසේම තුන්වන රාත්‍රියේ සාවිත්‍රී වේද ගීතිකාව උගන්වා බ්‍රාහ්මණයෙකු බවට පත්කර ගනී. අනතුරුව තමන් බ්‍රහ්මචර්ය ආශ්‍රමයට ඇතුළත් කර ගන්නා ලෙස ශිෂ්‍යයා ඉල්ලීම් කළ යුතුය. මෙසේ උපනයනයෙන් පසුව ආශ්‍රමයට ඇතුළු විය හැක්කේ ප්‍රධාන කුල තුන නියෝජනය කරන ශිෂ්‍යයන්ට පමණක් වන අතර, එහිදී ද ඒ ඒ කුලයන්ට අදාළ පරිදි යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. එහිදී බ්‍රාහ්මණ දරුවා 08 වන වියේදීත්, ක්ෂත්‍රිය දරුවා 11 වන වියේදීත්, වෛශ්‍ය දරුවා 12 වන වියේදීත් වශයෙන් උපනයනය සඳහා විශේෂිත වූ වයස් භේදයක් පවතී. මෙකී වයස් භේදය සේම එම කුල තුනට අදාළව කාල භේදයක්ද පවතී. එනම් පිළිවෙළින්, වසන්ත, ගිම්හාන හා සරත් වශයෙනි.

උපනයනය අවසානයේදී ශිෂ්‍යයන් ගුරුගෙදර වාසයට යන බව උපනිෂද් හි සඳහන් වේ. ඉගෙනුම සඳහා නියමිත කාලය අවුරුදු 12ක් බව උපනිෂද්වලින්ම පැහැදිලි වේ. ශ්වේතකේතු ගුරු ගෙදරින් සිය නිවසට පැමිණියේ වසර 12කට පසුවය. උපකෝශල, කාමලායන සත්‍යකාම ජබාලගේ නිවසෙහි නතරව වසර 12ක් යාගගිනි දැල්වීය (ඡා.උ. IV.10.1). සමහර උපනිෂද් විස්තරවලට අනුව මෙම කාලය වසර 12 ඉක්මවා ඇත (ජයවර්ධන, 2013: 134).

වර්තමානය දෙස බලන කලද දරුවකුගේ මූලික අධ්‍යාපනය වසර 12-13 ක් දක්වා පවතී. කෙසේ නමුත් මේ ආකාරයෙන් උපනයනයෙන් ශිෂ්‍ය භාවය ලබාගත් ශිෂ්‍යයා එම කාලය අවසන් වන තෙක් සියලු ලිංගික චර්යාවන්ගෙන් වෙන්ව බ්‍රහ්මචාරීව ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල යෙදිය යුතුය.

**ශිෂ්‍යයා සතු යුතුකම්**

බ්‍රහ්මචාරීව අධ්‍යාපන කටයුතුවල නිරතවන ශිෂ්‍යයා විසින් කළ යුතු මෙන්ම නොකළ යුතු දෑ බොහෝමයක් උපනිෂද් හි දැක්වේ. ඒ අනුව ශිෂ්‍යයා විසින්,

- අන්තේවාසික (නේවාසික) විය යුතුය.
- ගුරුවරයාට ප්‍රථම උදෑසනම අවදි විය යුතුය.
- හොඳින් ජලය පානය කළ යුතුය.
- ගුරු ගෙදර කටයුතු (ගව පාලනය, ගොවිතැන් ආදි වූ) කළ යුතුය.
- අවේලාවේ නින්දෙන් වැළකිය යුතුය.
- ඉගෙන ගන්නා අතරතුර දර සැපයීමෙන් යාග ගින්න නිවෙන්නට නොදී නඩත්තු කළ යුතුය.
- ගුරු ගෞරවයෙන් වාසය කළ යුතුය.
- භික්ෂාටනයෙන් ආහාර සපයා ගත යුතුය (ඡා.උ. IV.3.5).
- ගුරුවරයාට පසුව රාත්‍රී නින්දට යා යුතුය.

ආදි වශයෙන් ශිෂ්‍යයා සතු යුතුකම් රාශියක් විවිධ තැන්හි අපට හමුවේ. එම කරුණු දෙස බැලීමේදී පැහැදිලි වන්නේ උපනිෂද් ගුරුවරයා විසින් තම ශිෂ්‍යයා කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන්ද ඉතා ශක්තිමත් පුද්ගලයෙකු බවට පත් කළ බවයි. විශේෂයෙන් ගුරුගෙදර කටයුතු නැතිනම් දර සැපයීම, ගව පාලනය, ජලය සැපයීම, ගොවිතැන් කටයුතු ආදී වූ දෛනික කටයුතු ඔහු ලවා කරවීම තුළින් ගෘහ ජීවිතයට අවශ්‍ය හැකියාවන් ආයාසයකින් තොරවම ප්‍රායෝගිකවම ඔහු ඉගෙන ගනී. එසේම අවේලාවේ නින්දෙන් වැළකීම, ගුරුවරයාට ප්‍රථම අවදිවීම හා ඔහුට පසුව රාත්‍රී නින්දට යෑම, භික්ෂාටනයෙන් යැපීම යන කාරණා තුළින් ක්‍රියාශීලී හා ආත්ම දමනයෙන් යුතුව මානසික ඒකාග්‍රතාවයෙන් යුතු පුද්ගලයෙකු නිර්මාණය කිරීමට උත්සාහ ගෙන තිබේ. ඒ අනුව උපනිෂද් අධ්‍යාපනය පුද්ගල කේන්ද්‍රීය නැතිනම් ශිෂ්‍ය කේන්ද්‍රීය වූ අධ්‍යාපනයක් වන අතර එය සැම අතින්ම ඉතා ඵලදායී ප්‍රතිඵල ලබා දී ඇති බව පැවසීම යුක්ති සහගතය.

**ශිෂ්‍ය විනය හා නීතිරීති**

බාහිර මෙන්ම අභ්‍යන්තර හික්මීම ශිෂ්‍යයකු සතුවිය යුතු ප්‍රධාන ලක්ෂණයකි. අතීතයේ මෙන්ම වර්තමානයේත් ඒ සඳහා ගුරුවරුන් විසින් විවිධ ක්‍රමෝපායන් විශේෂයෙන් නීති මාලාවක් හා ඒවා කඩ කරන්නන්හට දඬුවම් ද නියම කරන ලදි. ප්‍රධාන වශයෙන් ස්වයං හික්මීමක් ශිෂ්‍යයා සතුව පැවතිය යුතුමය. උපනිෂද් අධ්‍යාපනය තුළද ශිෂ්‍යයන්ගේ හික්මීම පිණිස ඔවුන් පිළිපැදිය යුතු නැතිනම් අනුගමනය කළ යුතු කරුණු රාශියක් පැවති බව දක්නට ලැබේ. ඒ අතර,

1. අත්හල යුතු දේ : සුරාව, සූදුව, ජන සමූහ රැස්වන ස්ථානවලට යාම ආදියයි.
2. අනුගමනය කළ යුතු දේ : සත්‍ය වචන කථා කිරීම, පාන්දරින් අවදි වීම, කට පාඩම් කිරීම ආදියයි.
3. ඉටුකළ යුතු දේ : පිඬුසිඟීම, දවසට තෙවරක් ස්නානය, ව්‍රත චරනය, ගිනි පිදීම

ආදිය පිළිබඳ ශිෂ්‍යයා මනා අවබෝධයකින් කටයුතු කළ යුතුය. ඒ තුළින් සදාචාර සම්පන්න, සිල්වත් හා නීති ගරුක පුද්ගලයකු බිහි කිරීමේ අවශ්‍යතාව මොනවට පෙන්නුම් කරයි.

කේ. බී. ජයවර්ධන (2013) පවසන ආකාරයට, උපනිෂද් අධ්‍යයන හා අධ්‍යාපන දෙකේදී ගුරු-ශිෂ්‍ය දෙදෙනාම සිටගෙන නොසිටිය යුතුය. බිම පමණක් වාඩිවිය යුතුය. අනවශ්‍ය පරිදි ඇඳුම් පැළඳුම් නොදැරිය යුතුය. මාංශ ආහාර ගැනීමෙන් පසු සහ ලේ මළමිනි ආදිය දුටු කළ ඉගෙනීම් කටයුතු නොකළ යුතුය. එසේම ශරීරයේ තෙල් ගල්වා සිටින කල සහ ස්නානය නොකළ කල මෙන්ම වර්ණ ගන්වා හෝ මාලාදිය පැළඳ අධ්‍යයන කටයුතු නොකළ යුතුය, ආදි වශයෙන් ඓතරේය ආරණ්‍යකයෙහි දක්වා ඇති බවයි.

ඉහතින් දැක්වූ පරිදි ගුරුවරයා සේම ශිෂ්‍යයාද බාහිර ශුද්ධිය පිණිස මෙන්ම අභ්‍යන්තර ශුද්ධිය පිණිසද කටයුතු සම්පාදනය කළ යුතුය. ඉන්ද්‍රිය සංවරයෙන් හා ආධ්‍යාත්මික පුහුණුවෙන් යුතුව, බ්‍රහ්ම ඥානය ලබා ගැනීමට උත්සුක විය යුතුය. ඉවසීමෙන් හා මමත්වයෙන්

තොරව චිත්ත ඒකග්‍රතාවයෙන් යුක්තව හැම විටම කටයුතු කිරීමට වගවිය යුතුය. විශේෂයෙන්ම ගුරුවරයා සමීපයේ හිඳ ලබා ගන්නේ මූලික අධ්‍යාපනය නැතිනම් ප්‍රාථමික අධ්‍යාපනයක් පමණි. එනම් උපනිෂද් හි ඉගැන්වෙන උත්තරීතර බ්‍රහ්ම ඥානය සඳහා මාර්ග දර්ශනයක් පමණි. ශිෂ්‍යයාගේ උත්සාහය හා කැපවීමත් මත එකී රහස්‍ය දැනුම අවබෝධ කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**ගුරු-ශිෂ්‍ය සම්බන්ධය**

අධ්‍යයන ක්‍රියාවලියේදී ප්‍රධානතම කරුණකි ගුරු ශිෂ්‍ය සම්බන්ධය. උපනිෂද් වැනි ගුරුවරයාගේ අන්තේවාසිකව ඉගෙන ගන්නා කළ මෙකී සම්බන්ධය කෙතරම් වටින්නේ දැයි අමුතුවෙන් කිව යුත්තක්ද නොවේ. මෙකී සම්බන්ධයේ ශක්තිමත් භාවය හා පිවිතුරු භාවය තුළින් ගුණ-නැණ දෙකෙන් පෝෂිත ශිෂ්‍යයෙකු මෙන්ම බහුශ්‍රැත දක්ෂ ගුරුවරයෙකු ද බිහිවන්නේය.

උපනිෂද් කිහිපයකම අපට හමුවෙන පරිදි ගුරුවරයාගේ සහ ශිෂ්‍යයාගේ අවසන් ප්‍රාර්ථනය එකක්ම විය. නිදසුන් ලෙස කඨෝපනිෂදයේ 'යම' නම් ගුරුවරයා හා 'නචිකේතස්' නම් ශිෂ්‍යයාගේ ප්‍රාර්ථනාව පෙන්වා දිය හැකිය. එවන්;

''හේ අප දෙදෙන රකීවා. හේ අප දෙදෙන තේරුම් ගනීවා. අප දෙදෙන එක්ව වීර්ය කරමු. අපි දෙදෙනා යමක් ඉගෙන ගන්නා ලදද එය තෙදවත් වේවා. අපි දෙදෙනා කිසිවිටකත් ඔවුනොවුන්ට ද්වේෂ නොකරම්ව. ඕම් ශාන්තිඃ ඕම් ශාන්තිඃ ඕම් ශාන්තිඃ'' (කඨ.උ. 19).

එසේ බලන විට උපනිෂද් ගුරුවරයා හා ශිෂ්‍යයා අතර පැවති සම්බන්ධය කෙබඳුද යන්න අපට පැහැදිලිව දැකගත හැකිය. එය අද්‍යතන ගුරු-ශිෂ්‍ය දෙපාර්ශ්වයටද මහත් ආදර්ශයක් සපයන බව කිව යුතුමය.

**ගුරුවරයාගේ යුතුකම් හා වගකීම්**

මෙතෙක් අප කළ සාකච්ඡාව තුළ බොහෝ කරුණු දක්වන ලද්දේ ශිෂ්‍යයා සතු යුතුකම් හා වගකීම් හා ඔහුගේ කාර්යය පිළිබඳවය. එය එසේ වන්නා සේම ගුරුවරයා සතුවද එවැනිම යුතුකම් සමුදායක් පවතී. එනම් තමන්ගෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයා වෙනුවෙන් ඔහු එම යුතුකම් නිසියාකාරයෙන් ඉටුකළ යුතුය. එහි සාර්ථකත්වය මත ශිෂ්‍යයා තුළ ගුරුවරයා කෙරෙහි මනාවූ ගෞරවයක් ගොඩනැගීම නිරායාසයෙන් සිදුවන්නේය.

ගුරුවරයාට ඉතාම උසස් චරිතයක් තිබිය යුතුය. අධ්‍යාත්මික දියුණුවක්ද ඔහු සතු විය යුතුය. පරම ඥානය හෙවත් බ්‍රහ්ම ඥානය පිළිබඳ රහස් ඔහු දැනගෙන තිබිය යුතුය. ඔහු ශාස්ත්‍රය පිළිබඳ දැඩි ස්ථාවරයක සිටිය යුතුය. එසේ නොවන ගුරුවරයා අන්ධයකුට මඟ පෙන්වන්නට යන තවත් අන්ධයකු වැනි වේ. ගුරුවරයා සත්‍ය හොඳින් දැනගෙන සිටිය යුතුය (මු.උ. 1. 2. 13). සුදුසුකම් ඇති ශිෂ්‍යයෙකු තමා වෙතට පැමිණි විට තමන් අවබෝධ කොටගත් සියල්ල නිසි පරිදි ශිෂ්‍යයාටද ඉගැන්විය යුතුය. තම දැනීමෙන් කිසිවක් නොසැඟවිය යුතුය. එසේ සඟවන්නේ නම් එය තමාගේ විනාශයක් සේ සලකා ඇත (කේ. බී. ජයවර්ධන, 2013 ඃ 140).

කේ. බී. ජයවර්ධන (2013) වැඩිදුරටත් පවසන ආකාරයට උපනිෂද් අධ්‍යාපන ක්‍රමය තුළ ගුරුවරයාට යම් අවස්ථාවක තම දැනුම පිළිබඳ සැකයක් මතුවේ නම්, තමාට වඩා සුදුසු වෙනත් ගුරුවරයෙකු කරා තම ශිෂ්‍යයන් යොමු කිරීම දැකිය හැකිය. ඒ සඳහා ගෝපථ බ්‍රහ්මණයෙහි එන මෞද්ගල්‍ය හා මෛත්‍රේය යන ආචාර්වරුන්ගේ සාකච්ඡාව ගෙනහැර දක්වයි. තමා උගන්වමින් සිටි විෂයය පිළිබඳ දැනුම තමාට අවම බව වටහාගත් මෛත්‍රේය ආචාර්යරයා තමා එම දැනුම සම්පූර්ණ කරගන්නා තුරු නැවත ඉගැන්වීම නොකරන බව පැවසූ අතරම, තම ශිෂ්‍ය කණ්ඩායම වෙනත් ගුරුවරයකු වෙත යොමු කළ බව දක්වයි.

ඒ අනුව උසස් චරිතවත් ගුරුවරයක් ඉහත දැක්වූ යුතුකම් ඉටුකරන අතරම, මමත්වයෙන් තොරව, ආත්ම දමනයෙන් යුතු නම්‍යශීලී පුද්ගලයෙක් විය යුතු බව පැහැදිලිය. එවන් ගුරුවයෙකු

ලැබීමට සෑම ශිෂ්‍යයකුටම අයිතියක් ඇත. එසේම එවැන්නෙකු ලැබීම ශිෂ්‍යයාගේ භාග්‍යයකි.

**උපනිෂද් හි අන්තර්ගත විෂය ධාරාව**

වින්ටර්නිට්ස් (1967) සඳහන් කරන අන්දමට උපනිෂද්හි මූලික දෘෂ්ටය නම් ආත්මන් හා බ්‍රහ්මන් පිළිබඳ තත්ව ඥානයයි. ''විශ්වය නම් බ්‍රහ්මන්ය'' (වින්ටර්නිට්ස්, 1967). එසේම ''බ්‍රහ්මන් නම් ආත්මයයි'' (වින්ටර්නිට්ස්, 1967) යන්න තුළින් එය මැනවින් පෙනේ. ඔහු තවදුරටත් දක්වන්නේ උපනිෂද් චින්තකයන්ගේ සම්පූර්ණ චින්තාවම බ්‍රහ්මන් හා ආත්මන් යන සංකල්ප දෙක වටා පවතින බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ උපනිෂද් දර්ශනය වටහා ගැනීමට නම් මෙකී ආත්මන් හා බ්‍රහ්මන් යන සංකල්ප දෙක මනාව අවබෝධ කරගත යුතු බවයි.

කුඩාකත්නෝරුවේ විනීත හිමි (2011) දක්වන ආකාරයට මාධාවාචාර්තුමන්ගේ මතය වන, ආත්මන් හා බ්‍රහ්මන් භින්නත්වය නැතිනම් ද්වෛත බව තහවුරු කිරීම උපනිෂද් දර්ශනයේ ප්‍රධාන අරමුණ බවයි. එසේ වුවත් උපනිෂද් සඳහා භාෂ්‍ය සැපයූ ශංකරාචාර්තුමා ආත්මන් හා බ්‍රහ්මණ්ගේ අද්වෛතය විස්තර කිරීම දක්නට ලැබෙන බවයි. ඒ කෙසේ වුවත් බලදේව උපාධ්‍යාය අවධාරණය කරන අන්දමට 'ආස්තික හා නාස්තික' වූ සියලු භාරතීය දර්ශනවලට අයත් මූල සිද්ධාන්ත උපනිෂද් දර්ශනය තුළ අන්තර්ගත වන බවයි.

උපනිෂද් දර්ශනයේ අන්තර්ගත දාර්ශනික සංකල්පනාවන් අතරින් ඉතා වැදගත් වන එක් සංකල්පනාවක් වශයෙන් 'සද්භාවවේදී' ඉගැන්වීම හඳුන්වා දිය හැකිය. එහිදී උපනිෂද් ආචාර්වරුන් පෙන්වා දෙන්නේ පැවැත්මට බලය දෙන්නේ බ්‍රහ්මන් බවයි. එමගින් ගම්‍යවන ප්‍රධාන අරුත නම් උපනිෂද් සද්භාවවේදී හෙවත් පැවැත්ම පිළිබඳ ඉගැන්වීම බ්‍රහ්මන් මුල්කර ගෙන ඉදිරිපත් වී ඇති බවයි (රත්නාලෝක හිමි, 2019 : 93).

කෙසේ වුවත් ආත්මන් හා බ්‍රහ්මණ් පිළිබඳ ඉගැන්වීම මූලික කරගත් උපනිෂද්හි ඊට පරිබාහිර විෂයයන් පිළිබඳ සාකච්ඡා නොකරන්නේ යැයි කිව නොහැකිය. මන්ද? රාජ්‍ය පාලනයේදී කුමාරවරුන්ට හා දෛනික ජීවිතයේදී වෛශ්‍යයන් හට විවිධ වූ

විෂයයන් පිළිබඳ විශේෂ දැනුමක් ලබාදීමට අවශ්‍ය වේ. ඒ ආකාරයෙන් බලන කල ත්‍රිවේදය ඉගෙන ගත් ශිෂ්‍යයා අථර්ව වේදය, වේදාංග හා ඉතිහාස මෙන්ම පුරාණ කථා පිළිබඳ දැනුම ලබාගත්හ. එසේම වීරයන්ගේ - වීරවරියන්ගේ වෘත්තාන්ත අන්තර්ගත වීර කථා පිළිබඳවද ඔහු දැනුම ලබාගත්හ. එපමණක් නොව වාදන්‍ය හෙවත් තර්ක ශාස්ත්‍රය, මිථ්‍යා කථා, ආඛ්‍යාන, අන්වාඛ්‍යාන, ව්‍යාඛ්‍යාන අනු ව්‍යාඛ්‍යාන ආදි බොහෝ විෂයයන් පිළිබඳ පෘතුල දැනුමක් කරා ශිෂ්‍යයා යොමු කළ බව පැහැදිලිව දක්නට ලැබේ. මුලින් පැවසූ පරිදි වේදාධ්‍යයනයට ඍජු සම්බන්දයක් නොමැති විෂය ධාරාවක්ද උපනිෂද් ගුරු කුලවල උගන්වා ඇති අතර, ඒවායෙන් කිහිපයක් පහත පරිදි පෙන්වා දීමට හැකිය.

- ක්ෂත්‍රවිද්‍යා - යුද්ධ විද්‍යාව හා ශිල්පය
- රාශී - සංඛ්‍යා විද්‍යාව හෙවත් ගණිතය
- නක්ෂත්‍ර - තාරකා රාශීන් පිළිබඳ විද්‍යාව
- භූත විද්‍යා - භූතයන් පිළිබඳ ශාස්ත්‍රය
- සර්ප විද්‍යාව - සර්පයන් පිළිබඳ විද්‍යාව
- දෛව - අනාගතය පවසන විද්‍යාව
- පිත්‍ර්‍ය - මියගිය පියවරුන් හා ඥාතීන් සම්බන්ධව පවත්වන පූජාවිධි සම්බන්ධ ශාස්ත්‍ර
- ඒකායන - ශංකරාචාර්‍ය මතයට අනුව නීති ශාස්ත්‍රය
- දේවවිද්‍යා - දෙවියන් පිදීම සම්බන්ධ විද්‍යාව
- දේවජනවිද්‍යා - සුවඳ විලවුන් නිෂ්පාදනය, ගායනය, නර්තනය, වාදනය වැනි සූක්ෂම මෙයට

ඇතුළත් වේ (කේ. බී. ජයවර්ධන, 2013 : 142-143).

ඉතා ගැඹුරු හා පුළුල් විෂයමාලාවක් උපනිෂද් ගුරුකුල තුළ උගන්වා ඇති බව දැකගත හැකිය. කෙසේ නමුත් මෙම සියලු විෂයයන් එක් ශිෂ්‍යයෙක් විසින් හැදෑරිය යුතු යැයි නියම කළ බවක් දක්නට නොමැත. නමුත් උපනිෂද් ගුරුවරුන් නිරන්තරයෙන් උත්සාහ කර ඇත්තේ තම ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම

තුළින් ලෝකෝත්තර ඥානය නැතිනම් විමුක්තිය කරා ඔහු යොමු කිරීම වූ බැවින් ලෞකික විෂයයන් පිළිබඳ ඔවුන් තුළ නිරන්තර සාකච්ඡා පැවති බව කියවේ. ඡාන්දෝග්‍ය උපනිෂදයේ සඳහන් පහත ප්‍රකාශය උපනිෂද් විෂය ධාරාව පිළිබඳ අපට ඉතා වටිනා තොරතුරු රාශියක් ලබා දේ. එය නාරද, සනත්කුමාර වෙත ගොස් කරන ආත්ම වර්ණනාවකි.

භාග්‍යවතුනි, ඍග්වේද, යජුර්වේද, සාමවේද, හා සිව්වැන්න ලෙස අථර්වවේදය ද, පස්වැනි වේදය ලෙස මහාකාව්‍ය, මිථ්‍යාකාව්‍ය හා ව්‍යාකරණ ද, මරණ ලේඛන ශාස්ත්‍රය ද, ගණිතය ද, පේන කීමේ ශාස්ත්‍රය ද, කාල නියම ශාස්ත්‍රය ද, න්‍යාය ශාස්ත්‍රය ද, දේශපාලන විද්‍යාව ද, දේවධර්ම විද්‍යාව ද, මළවුන්ගේ අනාගත සිද්ධීන් දැන ගන්නා ශාස්ත්‍රය ද, යුද්ධ ශිල්පය ද, ආකාශ වස්තු විද්‍යාව ද, සර්ප දමන ශිල්පය ද, සූක්ෂම කලා ද මවිසින් උගන්නා ලදි. ස්වාමීනි මේ සියල්ල උගත්ත ද ආත්මන් පිළිබඳ ඉගෙන ගෙන නැත (ඡා.උ. VII. 1) (කේ.බී. ජයවර්ධන, 2013 : 143).

ඒ අනුව ආත්මන් හා බ්‍රහ්මන් පිළිබඳ තත්ව ඥානය ඉගැන්වීම ප්‍රධාන අරමුණ කරගත් උපනිෂද් දර්ශනය තුළ ඊට එහා ගිය ඉතා පුළුල් විෂය ධාරාවක් විශේෂයෙන්ම ලෞකික ජීවිතය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය විෂය ධාරාවක් පැවත ඇති බව ඉතා පැහැදිලිය. එසේ බැලීමේදී උපනිෂද් අධ්‍යාපනය ඉතා දියුණු හා අද්විතීය වූවක් බව අවිවාදිතය.

**අධ්‍යාපනය ලබාදුන් ක්‍රම**

උපනිෂද් අධ්‍යාපනය පිළිබඳ කරුණු සෙවීමේදී දක්නට ලැබෙන ආකාරයට ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය ලබාදුන් ක්‍රමෝපායයන් කිහිපයක් අපට හඳුනාගත හැකිය. කේ. බී. ජයවර්ධන (2013) සඳහන් කරන ආකාරයට එහි ප්‍රධානම ක්‍රමය වූයේ සාකච්ඡාවයි. එනම් වාචෝද්ගත කිරීමෙන් ශාස්ත්‍රය පවත්වාගෙන යෑම සහ ඒවා නැවත නැවත ආවර්ජනය කිරීමයි. එසේම ක්‍රමානුකූලව සකස් කළ ප්‍රශ්න සමූහකයට පිළිතුරු සැපයීමද දැකිය හැකිය. එහිදී ප්‍රථමයෙන් ශිෂ්‍යයා ගුරුවරයාගෙන් ප්‍රශ්න කරයි. පසුව ගුරුවරයා නිදර්ශන සහිතව එය විස්තර කරයි (ප්‍රශ්න.උ. III.1-2). එහිදී ශිෂ්‍යයාට කල්පනා කිරීමට යමක් ඉතිරි නොකරම පිළිතුරු සපයා ඇති බව දක්වයි.

ප්‍රායෝගික අධ්‍යයන ක්‍රමය ද භාවිත කර ඇත. එය වර්තමානයේ ශිෂ්‍ය කේන්ද්‍රීය නමින් හඳුන්වන ක්‍රමයයි. ඒ බව බෘහදාරණ්‍යක හා ඡාන්දෝග්‍ය උපනිෂද්වලදී පරමාත්මන් සංකල්පය උගන්වා ඇති ආකාරයෙන් පැහැදිලි වේ. ශ්වේතකේතුගේ පියා මනස හා අනෙක් ඉන්ද්‍රියන් ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි තම පුතාට උගන්වයි. කායික ක්‍රියාවලිය මානසික ක්‍රියාවලිය හා සම්බන්ධ වන අයුරු ප්‍රායෝගික ක්‍රමයක් මාර්ගයෙන් පෙන්වා දෙයි. පළමුව තම පුතා සත්‍යය වූ උපවාසයකට යොමු කරයි. ඔහු දින 15ක් උපවාසයේ යෙදෙයි. සියලුම ආහාර වර්ජනය කරන අතර ජලය පමණක් දෙයි. ජීවය හා ප්‍රාණය කෙසේ පවතී දැයි එහිදී ප්‍රත්‍යක්ෂ කරදෙයි. ප්‍රාණය ජලය මත රඳා පවතින බව අවබෝධ කරවයි. පසුව වේදය කටපාඩමින් පවසන ලෙස පියා ශ්වේතකේතුට පවසයි. එහෙත් එය කළ නොහැකි විය. එයින් ඥානය මනසින් ගිලිහී ඇති බව ප්‍රකට කරයි. පසුව ආහාර ලබා දීම ආරම්භ කරයි. එවිට මනස අවදි වන්නට පටන් ගනියි. මනස ක්‍රියාත්මක වීමට නම් ආහාර අත්‍යවශ්‍ය බව ශ්වේතකේතු තේරුම් ගනියි. එමෙන්ම වචනයට තේජස අවශ්‍ය බව ද වටහා ගනියි. මේ අනුව පඤ්ච ඉන්ද්‍රියන් ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි ප්‍රායෝගික ක්‍රියාදාමයකින් තම පුතාට පියා උගන්වයි. මෙමගින් අධ්‍යයන කාර්යය ශිෂ්‍යයාගේ කටයුත්තක් බව පැහැදිලිව දක්වා ඇත (කේ. බී. ජයවර්ධන, 2013 ඃ 145).

කේ. බී. ජයවර්ධන (2013) වැඩි දුරටත් දක්වන ආකාරයට සාකච්ඡාවකදී පුද්ගලයන් අවම වශයෙන් තිදෙනෙක් සම්බන්ධ වී ඇත. ඔවුන් ප්‍රශ්නිත් (ප්‍රශ්න අසන්නා), අභිප්‍රශ්නිත් (හරස් ප්‍රශ්න අසන්නා) සහ ප්‍රශ්නවිවාක (පිළිතුරු සපයන්නා) වශයෙනි. මේ තුළින් ප්‍රධානව තර්කන හැකියාව දියුණු කිරීම අරමුණු කරගනියි. ශිෂ්‍යයා තම අද්දැකීම් මාර්ගයෙන්ම සත්‍ය ඥානය අවබෝධ කරගත යුතුය. ඒ සඳහා ඔහු අවස්ථා තුනක් අනුගමනය කළ යුතු බව දක්වයි. එනම්,

1. ශ්‍රවණ - ගුරුවරයා කියාදෙන දෙයට මැනවින් ඇහුන්කම් දීමඃ මේ සඳහා උපකාරී වන අංග 6ක් ඇත. එනම් උපක්‍රම, අභ්‍යාස, අපූර්වතා, ඵල, අර්ථවාද හා උත්පත්ති යනුයි.
2. මනන - චින්තනය හෙවත් මෙනෙහි කිරීම, සොයා බැලීම, අවබෝධ කොට ගැනීම

3. නිදිධ්‍යාසන - ධ්‍යානශීලීව භාවනා කිරීම, මානසික ඒකාග්‍රතාවයෙන් යුතුව නැවත නැවත මෙනෙහි කිරීම (බෘහ.උ. II. 4. 5) (කේ. බී. ජයවර්ධන, 2013 ඃ 145-146).

මේ ආකාරයෙන් උපනිෂද් අධ්‍යාපනය ලබාදුන් ක්‍රම පෙන්වා දීමට හැකිය. ආත්මඥානය ලබා ගැනීමට අවශ්‍ය ශිෂ්‍යයා තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම විනාශ කළ යුතු සේම බහුවිධ ලෝකය හෙවත් විඥානයේ බහුත්වය මුලිනුපුටා දැමිය යුතු බව අවධාරණය කරයි. ඒ සඳහා යෝගය ප්‍රගුණ කළ යුතුය. මෙකී ක්‍රමයන් තුළින් හා ඉන්ද්‍රීය දමනයෙන් යුක්තව ශිෂ්‍යයා ආත්මඥානය කෙරෙහි සිත් යොමු කළ යුතුය.

**ගුරුවරයාට සමුදීම**

වසර 12ක ශිෂ්‍ය අවධිය නිමකර නැවත ගම්රට බලා යාමට සූදානම් වන ශිෂ්‍යයා අමතා දේශනයක් පැවත්වීම සිරිතක්ව පැවති බව දක්නට ලැබේ. එය ඉතා වැදගත් ප්‍රකාශයක් වන අතර තෛත්තරීය උපනිෂදයේ එය දක්වන්නේ පහත පරිදිය.

සත්‍යම කථා කරනු. නුඹේ යුතුකම ඉටුකරනු. වේද අධ්‍යාපනය ප්‍රතික්ෂේප නොකරනු. වේද සජ්ඣායනය සැලකිල්ලෙන් ඉටුකරනු. ගුරුවරයාට පඬුරු පුද කිරීමෙන් පසු පූනනූල පිළිබඳ සැලකිලිමත් වනු. එය නොකඩනු. නුඹේ ගෝත්‍ර සම්බන්ධය නොබිඳෙන ලෙස ප්‍රවේශමෙන් කටයුතු කරනු. සත්‍යයෙන් හා යුක්තියෙන් නොගිලිහෙනු. ශරීරසෞඛ්‍යය පිළිබඳ සැලකිල්ල දක්වනු. නුඹේ ලෞකික දියුණුව පිළිබඳ සැලකිල්ල දක්වනු. වේදය ඉගෙනීමත් උගැන්වීමත් නොසලකා නොහරිනු. දෙවියන්ටත් මළගිය නෑයින්ටත් කළයුතු යාගකර්ම නොසලකා නොහරිනු. නුඹට නුඹේ මව දෙවි කෙනෙකු මෙන් වේවා. නුඹට නුඹේ පියා දෙවි කෙනෙකු මෙන් වේවා. නුඹට නුඹේ ගුරුවරයා දෙවි කෙනෙකු මෙන් වේවා. යම් ක්‍රියාවක් වැරදි නම් ඒවා පමණක් සැලකිය යුතුය. නිවැරදි සැමදේ සැමවිට තමා විසින්ම කරනු. අප විසින් කළ හොඳ කටයුතු පමණක් සිහි කරනු. අපට වඩා හොඳ තවත් බමුණන් සිටිය හැකිය. ඒ අයට නුඹ සුදුසු ගෞරවය දැක්විය යුතුය. යමක් දෙන විට එය අශ්‍රද්ධාවෙන් නොව ශ්‍රද්ධාවෙන් ද සතුටින් ද නිහතමානීව ද බියෙන් ද යුතුකමක් කරන හැඟීමෙන් ද දිය

යුතුය. ආගමික ශුද්ධක්‍රියාවක් හෝ චාරිත්‍රයක් පිළිබඳව නුඹේ සිත තුළ යම්කිසි සැකයක් ඇති වුවහොත් හොඳ තීරණ ගත හැකි බුද්ධිය ඇති බමුණන් එය සම්බන්ධයෙන් පිළිපදින ආකාරයෙන් නුඹත් පිළිපදින්න. මේ මාගේ අනුශාසනයයි. මේ මගේ ඉගැන්වීමයි. මේ වේදයේ සත්‍යය වූ සාරයයි. මේ ආඥාවයි. මෙසේ නුඹ පිළිපැදිය යුතුය. මෙය මෙසේම පිළිපැදිය යුතුය (තෛ.උ. I.11.1-11) (ජයවර්ධන, 2013: 138-139).

ගුරු ගෙදරට සමුදෙන ශිෂ්‍යයාට ගුරුවරයා විසින් ලබාදෙන අවසන් දේශනය කෙතරම් බරපතලද සහ කෙතරම් අනර්ඝ දැයි ඉතා පැහැදිලිය. ගුරු ගෙදරින් නික්ම ගියද ඔහුගේ ඉගෙනීම අවසන් නොවේ. මෙය මූලික අධ්‍යාපනය පමණි. මෙතැනින් පසු ඉගෙනීම ශිෂ්‍යයාගේ කැමැත්ත හා උත්සාහය මත රඳා පවතී. කෙසේ නමුත් උපනිෂද් ගුරුවරයාගේ ඉහත සමුදීමේ දේශනය ඉතා වටිනා අදහස් රාශියක්ම සමාජගත කොට තිබෙන බව පැහැදිලිය. එය වර්තමාන ශිෂ්‍යයන් හටද තම ජීවිත අර්ථවත් කරගැනීමට උපසථම්භක කරගත හැකි බවද කිව යුතුමය.

**සමාලෝචනය**

උපනිෂද් අධ්‍යාපනය පිළිබඳ ඉහතින් සාකච්ඡා කළ අන්දමට ඉතා ගැඹුරු හා දියුණු අධ්‍යාපන ක්‍රමයකට හිමිකම් කියන බව පැහැදිලිය. විශේෂයෙන්ම ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයකට හොඳම නිදසුනද උපනිෂද් අධ්‍යාපනයයි. උපනිෂද් පරම ඥානය උගැන්මට නම් තමන් ඊට සුදුස්සෙකු බව ඔප්පු කළ ශිෂ්‍යයන්ට පමණක් එකී රහස්‍ය ඥානය උගැන්මට අවස්ථාව හිමිවේ. කෙසේ නමුත් ඉහත තොරතුරු තුළින් උපනිෂද් යුගයේ පැවති ශාස්ත්‍රීය වූද ආගමික වූද උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රාමාණික වූ දැනුමක් ලබාගත හැකිය.

බ්‍රහ්ම ඥානය බ්‍රාහ්මණයන් විසින් ප්‍රධානව හැදෑරූ අතර, ක්ෂත්‍රිය හා වෛශ්‍ය යන දෙපිරිස එම ඥානයට අමතරව තම ගෘහස්ථ ජීවිතයට අදාළ වූ ලෞකික දෑ පිළිබඳ වූ අධ්‍යාපනය ලැබූහ. ඔවුන් වේදාධ්‍යයනය සඳහා තම ජීවිත කාලයම කැපකර නොමැත. මෙකී කරුණු කෙසේ වෙතත් එකල සමාජයේ සෑම අයෙකුටම අධ්‍යාපනය උරුම නොවීය. ප්‍රධාන කුල තුන හැර, ශුද්‍රකුල දරුවන් හා කාන්තාවන්ටද එකල අධ්‍යාපනය තහනම් දෙයක් වූහ. එසේ බැලීමේදී

එකල අධ්‍යාපනය වරප්‍රසාද ලත් පිරිසක් අතර පමණක් පැවතුණ බව පෙනේ. මෙම උපනිෂද් අධ්‍යාපන ක්‍රමවේදයේ ක්‍රමික විකාශය නූතන අධ්‍යාපන ක්‍රමය සඳහාද අඩුවැඩි වශයෙන් බලපෑ බව දැකිය හැකිය. නමුත් පරමාර්ථ වශයෙන් ගත් කල එය එකිනෙක විරුද්ධය. මන්ද? එවකට අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ලෝකෝත්තර විමුක්තියයි. නමුත් වර්තමාන අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය ලෞකික අභිවෘර්ධියයි.

වෛදික චින්තයේ උපරිම අවස්ථාව උපනිෂද් යුගය නියෝජනය කරන අතරම, වෛදික අධ්‍යාපනයේ උත්කෘෂ්ඨතම අවස්ථාවද එහි ම බව පැවසීම යුක්ති සහගතය. හුදු යාග-හෝම ක්‍රියා තුළින් ලෝක ඥනය, බ්‍රහ්ම ඥානය නැතිනම් පරම සත්‍ය අවබෝධ කරගත නොහැකි බව වටහාගත් මානවයන් විසින් තම තමන්ට සුදුසු ගැළපෙන ගුරුවරුන් සොයා ගොස් ඔවුන් සමීපයේ හිඳ, තම තමන්ගේ ගැටලු සඳහා වූ නිවැරදි පිළිතුරු ගවේෂණයෙහි යෙදුණාහ.

පෙර සඳහන් කළ පරිදිම නූතන අධ්‍යාපනය හා උපනිෂද් අධ්‍යාපනය අතර, සැලකිය යුතු විශාල වෙනස්කම් නැතිනම් පරතරයක් තිබෙන බව පිළිගත යුතුමය. එය කෙසේවත් එකිනෙකට සමාන කළ නොහැකිය. විශේෂයෙන් පාසල් අධ්‍යාපනය එහිදී ප්‍රධානය. නමුත් අදටත් බෞද්ධ පාරිවේණික අධ්‍යාපනය තුළ එකී පැරණි උපනිෂද් අධ්‍යාපන ක්‍රමයේ ඡායාවන් දක්නට ලැබෙන බවද මෙහිදී පැවසිය යුතුය.

**කෙටි සලකුණු**

- ඡා.උ. - ඡාන්දොග්‍ය උපනිෂදය
- කඨ.උ. - කඨෝපනිෂදය
- මු.උ. - මුණ්ඩකෝපනිෂදය
- ප්‍රශ්න. උ - ප්‍රශ්න උපනිෂදය
- බෘහ. උ - බෘහදාරණ්‍යක උපනිෂදය
- තෛ.උ. - තෛතරේය උපනිෂදය

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඉන්දජෝති හිමි, බලදොර. (2013). 'උපනිෂද්සාහිත්‍යය හැඳින්වීම'. වැලිමිටිහාවේ ඥානරතන, බලදොර ඉන්දජෝති, උඩුගලදෙණියේ ධම්මවිමල, බ්‍රර්ට්‍රම් ජී. ලියනගේ (සංස්.) *විද්‍යාලඞ්කාර ශාස්ත්‍රීය සංග්‍රහය* (උපනිෂද් අධ්‍යනය). කැළණිය පැලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන

ජයවර්ධන, කේ. බී. (2013). 'උපනිෂද් සාහිත්‍යයෙන් මතුවන අධ්‍යාපනික සංකල්පය'. වැලිමිටිහාවේ ඥානරතන හිමි, බලදොර ඉන්දජෝති හිමි, උඩුගලදෙණියේ ධම්මවිමල හිමි, බ්‍රර්ට්‍රම් ජී. ලියනගේ (සංස්.) *විද්‍යාලඞ්කාර ශාස්ත්‍රීය සංග්‍රහය* (උපනිෂද් අධ්‍යනය). කැළණියඃ පැලියගොඩ විද්‍යාලඞ්කාර පිරිවෙන

නන්ද හිමි, ඇකිරියගල. (2004). 'බෞද්ධ අධ්‍යාපනයේ වෛදික පසුබිම'. වරාගොඩ පේමරතන හිමි (සංස්.) *භාරත ශාස්ත්‍රීය දායාද* (පූජ්‍ය. ශාස්ත්‍රවේදී කරඬුපනේ පේමසිරි හිමි උපහාරය). කොළඹඃ සමයවර්ධන ප්‍රකාශන

විනීත හිමි, කුඩාකත්නෝරුවේ. (2011). 'ඥානය' පිළිබඳ උපනිෂද් ඉගැන්වීම්'. කොටපිටියේ රාහුල හිමි, මැදගම්පිටියේ විජිතධම්ම හිමි, මිරිස්වත්තේ විමලඥාන හිමි (සංස්.) *දර්ශන අධ්‍යයන* (දර්ශනපති හෝමාගම ධම්මානන්ද නා හිමි අභිනන්දන ශාස්ත්‍රීය කලාපය). වාද්දුවඃ ප්‍රවචනෝදය පිරිවෙන

වින්ටර්නිට්ස්, එම්. (1967). *ඉන්දීය සාහිත්‍යය ඉතිහාසය* (1 වන කාණ්ඩය). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

රත්නාලෝක හිමි, ගලඋඩ. (2019). 'උපනිෂදයෙහි පැණෙන දාර්ශනික සංකල්ප පිළිබඳ කෙටි විමසුමක්'. *දාර්ශනික සංකථන*. මහනුවරඃ බුවනෙක ප්‍රකාශන

හිරියන්න, ඇම්. ඒ. (2014). *සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය*. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දේපාර්තුමේතුව

Chandogya Upanishad. (eds.) (1993). *Govindabhawana-karyalaya*. Gita Press: Gorakhpur.

Mahadeva Sastri. (1903). *Taittiriya Upanishad The Exhortation* [Lesson XI] (Retrieved April 06, 2024 from Wisdom Library (wisdomlib.org)

*Mundka Upanishad With Translation Shankara*. (eds.) (1992). Govindabhawana-karyalaya. Gita Press: Gorakhpur.

Prashna Upanishad. (eds.) (1992). *Govindabhawana-karyalaya*. Gita Press: Gorakhpur.

Sridara shâsttri Pâtkak (eds.) (1841) *Kathakopanishad With Sankara Bhasya*. Oriental Book Supplying Agency: Poona

Swāmī Mādhavānanda (1950) *Yajnavalkya and Maitreyi* (I) [Section IV] The Exhortation [Lesson XI] (Retrieved April 06, 2024 from Wisdom Library (wisdomlib.org)